**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**ශාස්ත්‍ර පීඨය**

# ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය (මාර්ගගත)
# පළමු සෙමෙස්තරය – 2020/2021
# GYG 2127: ජනසංඛ්‍යා භූගෝල විද්‍යාව

**ශිෂ්‍යයන් සඳහා උපදෙස්:**

01. ප්‍රශ්න පත්‍රය දෙවන පිටුවේ සිට ආරම්භ වේ.
02. සියලුම ලිඛිත ඇගයීම් **අත් අකුරින් පමණක්** ලිවිය යුතුය. ඔබේ අත් අකුරු පැහැදිලි ව ලිවීමට වග බලා ගන්න.
03. ඔබේ පිළිතුරු **A4 ප්‍රමාණයේ** කඩදාසියක ලියන්න (සීආර් කොළ හෝ ෆුල්ස්කැප් කොළ මේ සඳහා භාවිත කළ හැකිය). පිළිතුරු ලිවීමේ දී **කළු බෝල් පොයින්ට් පෑනක්** භාවිත කිරීම සුදුසු වේ.
04. සාමාන්‍ය පරීක්ෂණයකදී මෙන් ඔබේ පිළිතුරු පරිගණකගත කිරීම හෝ යතුරු ලියනය කිරීමට අවසර නොලැබේ. නමුත් දෘශ්‍යාබාධිත සිසුන් වැනි විශ්වවිද්‍යාල පාලනාධිකාරිය විසින් අවසර ලබා දී ඇති සිසුන් සඳහා මෙම නියමය අදාළ නොවේ.
05. කරුණාකර **ඔබේ විභාග අංකය පිළිතුරු පත්‍රයේ සෑම පිටුවකම ඉහළ දකුණු කෙළවරේ** සටහන් කරන්න. පිළිතුරු පත්‍රයේ කිසිදු ස්ථානයක ඔබේ නම සඳහන් කිරීමෙන් වළකින්න.
06. පහත දැක්වෙන ආකෘතිය භාවිත කර පිළිතුරු පත්‍රයේ **පහළ පිටු** අංකනය කරන්න: උදා. එය පිටු 5 කින් සමන්විත නම් 1/5, 2/5… ආදී වශයෙන්.
07. ඔබේ පිළිතුරු පත්‍රයේ පළමු පිටුව ලෙස **පොදු මුල් පිටුව** (එය LMS මගින් ලබාගත හැකි ය.) භාවිත කරන්න. අදාළ පොදු මුල් පිටුව මුද්‍රණය කිරීමෙන් හෝ අත් අකුරින් පිටපත් කිරීමෙන් ඔබට ලබා ගත හැකි වේ.
08. පිළිතුරු පත්‍රයේ **මුළු පිටු ගණන** ඔබේ පිළිතුරු පත්‍රයේ මුල් පිටුවේ සඳහන් කළ යුතු ය.
09. **පිළිතුරු පිටපතෙහි ඡායාරූප පරිලෝකනය කර (Scan) එය තනි PDF ගොනුවකට පරිවර්තනය කරන්න**. පරිලෝකනය කරන ලද රූපයේ සම්පූර්ණ පිටුව නිසියාකාරව ආවරණය වී ඇති බවට වග බලා ගන්න.
10. පිළිතුරු පත්‍රයේ පරිලෝකනය කළ රූපය පැහැදිලි හා කියවිය හැකි බවට වග බලා ගන්න.
11. LMS වෙත තනි පිටු වෙන වෙනම උඩුගත කිරීමට (Upload) ඉඩ නොදෙන බව සලකන්න.
12. **පිළිගත හැකි එකම ගොනු ආකෘතිය PDF වේ. අපේක්ෂකයාගේ විභාග අංකය PDF ගොනුවේ නාමය ලෙස භාවිත කළ යුතු ය.** උදා. A 12345.
13. ඔබගේ පිළිතුරු පත්‍රය JPEG/JPG හෝ වෙනත් ගොනු වර්ගයකින් උඩුගත කිරීමට (Upload) ඔබට අවසර නොලැබේ.
14. ඔබගේ ලිඛිත පරීක්ෂණවල අවසාන අනුවාදය **පැය 05 ක් ඇතුළත** LMS වෙත උඩුගත කිරීමට (Upload) කටයුතු කරන්න.
15. ඔබගේ පිළිතුරු පත්‍රය නිසි ආකාරයට යොමු කළ බව සනාථ කරගැනීම සඳහා 'ඉදිරිපත් කරන ලදී (Submitted)' යන වචනය සමඟ LMSහි **සම්පූර්ණ පිටුවේ තිර රුවක් (Screen shot)** ගන්නා ලෙස සිසුන්ට උපදෙස් දෙනු ලැබේ.
16. LMS වෙත පිළිතුරු පත්‍රයක් උඩුගත කිරීමේදී (Upload) යම් තාක්ෂණික ගැටලුවක් ඇති වේ නම් අපේක්ෂකයෙකුට ඔවුන්ගේ පිළිතුරු පිටපත විද්‍යුත් තැපෑලෙන් exam2@arts.cmb.ac.lk වෙත හැකි ඉක්මණින් යොමු කරන්න.

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

## ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය (මාර්ගගත)

## පළමු සෙමෙස්තරය – 2020/2021

## GYG 2127: ජනසංඛ්‍යා භූගෝල විද්‍යාව

<u>**කාලය**</u>: සම්පූර්ණ කළ පිළිතුරු පත්‍රය **පැය පහක් (05)** ඇතුළත LMS වෙත උඩුගත කිරීමට කටයුතු කරන්න
ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සමන්විත ය. ප්‍රශ්න **<u>තුනකට (03)</u>** පමණක් පිළිතුරු සපයන්න.
ප්‍රශ්නවල එක් එක් කොටස සඳහා **උපරිම වචන සංඛ්‍යාව සහ ලකුණු** සඳහන් කර ඇත.

---

1.

(අ) රටක ජාතික සංගණන ක්‍රියාවලියේ දී භූගෝල විද්‍යාත්මක දැනුම ප්‍රයෝජනවත් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (උපරිම වචන 250: ලකුණු 05)

(ආ) රටක ජනසංඛ්‍යාවට අදාළ ආර්ථික තොරතුරු ලබාගැනීමේදී විවිධ ප්‍රජාවිද්‍යාත්මක දත්ත මූලාශ්‍ර ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි නිදසුන් සහිතව විමසන්න.
(උපරිම වචන 750: ලකුණු 15)

2.

(අ) එවරට් ලී (Everett Lee,1966)ට අනුව සංක්‍රමණ කෙරෙහි බලපාන සාධක කෙටියෙන් විස්තර කරන්න. (උපරිම වචන 250: ලකුණු 05)

(ආ) රටක අභ්‍යන්තර සංක්‍රමණ ධාරා කෙරෙහි ඉහත සඳහන් කළ සාධකවල බලපෑම සුදුසු උදාහරණ සහිතව විග්‍රහ කරන්න. (උපරිම වචන 750: ලකුණු 15)

3.

(අ) රටක ජනසංඛ්‍යා වර්ධන රටාව හඳුනා ගැනීමේ දී වයස්-පුමිතිරි පිරමිඩවල ප්‍රයෝජන පැහැදිලි කරන්න. (උපරිම වචන 250: ලකුණු 05)

(ආ) සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර වයස්-පුමිතිරි සංයුතියේ සමාන අසමානතා නිශ්චිත නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.
(උපරිම වචන 750: ලකුණු 15)

4.

(අ) රටක සාඵල්‍යතා රටාව තීරණය කිරීම සඳහා වයස්-විශේෂිත සාඵල්‍යතා අනුපාතිකවල (ASFRs) වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න. (උපරිම වචන 250: ලකුණු 05)

(ආ පහත 01 වගුවෙහි රටවල් දෙකක් සඳහා (A සහ B) සාඵල්‍යතාව සම්බන්ධ දත්ත දැක්වෙයි. වගුවෙහි සපයන ලද දත්ත භාවිත කරමින් එම රටවල් දෙකෙහි සාඵල්‍යතා රටාවන් විශ්ලේෂණය කරන්න. (උපරිම වචන 750: ලකුණු 15)

01 වගුව

| | වයස් විශේෂිත සාඵල්‍යතා අනුපාතික (කාන්තාවන් 1000කට) | |
|---|---|---|
| මවගේ වයස (අවුරුදු) | A රට | B රට |
| 15-19 | 10 | 130 |
| 20-24 | 48 | 264 |
| 25-29 | 90 | 269 |
| 30-34 | 89 | 237 |
| 35-39 | 42 | 189 |
| 40-44 | 8 | 87 |
| 45-49 | 0 | 23 |
| | | |
| මුළු ස්ත්‍රී ජනසංඛ්‍යාව | 4311300 | 7870000 |
| පළමු විවාහයේ සාමාන්‍ය වයස (ගැහැණු) අවුරුදු | 29.3 | 17.9 |

5.

(අ) ප්‍රජාවිද්‍යා සංක්‍රාන්තියත් සමඟ රටක මුළු ජනසංඛ්‍යාව ක්‍රමයෙන් වෙනස් වන ආකාරය විස්තර කරන්න. (උපරිම වචන 250: ලකුණු 05)

(ආ) ප්‍රජාවිද්‍යාත්මක සහ සමාජ-ආර්ථික ලක්ෂණ භාවිත කරමින් ප්‍රජාවිද්‍යා සංක්‍රාන්තියේ ඉහළ ස්ථාවර අවධිය සහ පහළ ස්ථාවර අවධිය සසඳන්න. (උපරිම වචන 750: ලකුණු 15)

6.

(අ) අප්‍රිකානු කලාපයේ ආහාර අර්බුදයේ සමාජයීය බලපෑම කෙටියෙන් සාකච්ඡා කරන්න. (උපරිම වචන 250: ලකුණු 05)

(ආ) වර්ෂ 2030 වන විට දෙවන තිරසාර සංවර්ධන ඉලක්කය (SDG) වන කුසගිනි දුරලීම (Zero hunger) සාක්ෂාත් කර ගැනීම උදෙසා ආහාර අර්බුදය අවම කිරීම සඳහා ගත හැකි සුදුසු ක්‍රියාමාර්ග උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (උපරිම වචන 750: ලකුණු 15)

=============